# NLDB

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

## ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලය (NLDB)

# ඇබෑර්තු සඳහා අයදුම්පත් කැඳවීම

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ (NLDB) පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා අවශ්‍ය පරිදි සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංකය | තනතුර | ඇබෑර්තු ගණන |
|---|---|---|
| 01 | ක්ෂේත්‍ර / පශුසම්පත් සහකාර | 20 |
| 02 | රියදුරු | 10 |
| 03 | ට්‍රැක්ටර් රථ ක්‍රියාකරු | 10 |

**01 ක්ෂේත්‍ර / පශු සම්පත් සහකාර**

**අධ්‍යාපන සුදුසුකම්**

අ.පො.ස. (සා/පෙළ) විභාගය සිංහල / දෙමළ භාෂා හා ගණිතය ඇතුළත්ව සම්මාන සාමාර්ථ 04 ක් සමග ඉංග්‍රීසි භාෂාවද ඇතුළත්ව විෂයයන් 06 කින් සමත්වීම

සහ

අ.පො.ස. (උපෙළ) විභාගය විෂයයන් තුනකින් සමත්වීම. (පොදු ප්‍රශ්න පත්‍රය හා ඉංග්‍රීසි විෂය ප්‍රශ්න පත්‍රය හැර)

**වයස් සීමාව :** අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** MA 1- 2 - 2025 - රුපියල් 46,220/- - 10 x 540/-, 07x630/-, 12 x 1,080/-, 12 x 1,280/-, 84,350/-

**වෙනත් දීමනා :** ජීවන අංක දීමනාව - රුපියල් 17,800/-, අභ්‍යන්තර හා බාහිර වෛද්‍ය ප්‍රතිලාභ

**02 රියදුරු**

**අධ්‍යාපන සුදුසුකම්**

අ.පො.ස. (සා/පෙළ) විභාගය සිංහල / දෙමළ හා ගණිතය ඇතුළත්ව විෂයයන් 06 කින් සමත්වීම.

සහ

බර වාහන ධාවනය සඳහා වලංගු බලපත්‍රයක් සමග ප්‍රසිද්ධ ආයතනයක බර වාහන පැදවීමේ අවම වසර තුනක (03) පළපුරුද්ද.

**වයස් සීමාව :** අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** PL 3 - 2025 - රුපියල් 43,280/-, 10 X 490/- -10 X 540/- - 10 X 590/- - 12 X 630/- - 67,040/-

**වෙනත් දීමනා :** ජීවන අංක දීමනාව - රුපියල් 17,800/-, අභ්‍යන්තර හා බාහිර වෛද්‍ය ප්‍රතිලාභ

**03 ට්‍රැක්ටර් රථ ක්‍රියාකරු**

**අධ්‍යාපන සුදුසුකම්**

අ.පො.ස. (සා/පෙළ) විභාගය සිංහල / දෙමළ භාෂා හා ගණිතය විෂයයන් ඇතුළත්ව විෂයයන් 06 කින් සමත්වීම.

සහ

බර වාහන ධාවනය සඳහා වලංගු බලපත්‍රයක් සමග ප්‍රසිද්ධ ආයතනයක බර වාහන පැදවීමේ අවම වසර තුනක (03) පළපුරුද්ද.

**වයස සීමාව :** අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** PL 3 - 2025 - රුපියල් 43,280/- - 10 X 490/- - 10 X 540/- -10 X 590/- - 12 X 630/- - 67,040/-

**වෙනත් දීමනා :** ජීවන අංක දීමනාව - රුපියල් 17,800/-, අභ්‍යන්තර හා බාහිර වෛද්‍ය ප්‍රතිලාභ

**සේවයේ යෙදවීමේ නියමයන් :**

- ස්ථිර පත්වීමකි.
- රජයේ හා NLDB ආයතනයේ නියමයන් හා රෙගුලාසි වලට යටත්ය.

**අයදුම්කළ යුතු පිළිවෙල :**

අදුම්කරුවන් විසින් තම සම්පූර්ණ ජීව දත්ත අදාළ සහතිකවල පිටපත් හා ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනකුගේ විස්තර ඇතුළත්ව අයදුම්පත් යොමු කළ යුතුය.

**අයදුම්පත් භාරදිය යුතු අවසන් දිනය :**

අදාළ අයදුම්පත්, ඉහත සඳහන් ලිපිනය වෙත, 2026 පෙබරවාරි 06 වන දිනට පෙර යොමු කළ යුතුය. ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

**වැදගත් සටහන් :**

- කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් ලිඛිත විභාගය හෝ / සහ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.
- මොනයම් ආකාරයක හෝ බලපෑම් සිදු කිරීම නුසුදුසු භාවයක් ලෙස සලකනු ලැබේ.
- ලැබී ඇති අයදුම්පත්, කිසිදු හේතු දැක්වීමකින් තොරව පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ඇති අයිතිය මණ්ඩලය සතුවේ.

අවශ්‍ය වැඩිදුර විස්තර, දුරකථන අංක 011-7173326 මගින් හෝ ඊමේල් - nldbhr@gmail.com මගින් මානව සම්පත් අංශය ඇමතීමෙන් ලබාගත හැක.

අයදුම්පත්, අදාළ බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුරු නාමය සඳහන් කොට, ලියාපදිංචි තැපැලෙන් සභාපති, ජාතික පශු සම්පත් මණ්ඩලය, අංක 40, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05 යන ලිපිනයට ලැබීමට සැළැස්විය යුතුය.

රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුය.

**සභාපති,**
**ජාතික පශුසම්පත් මණ්ඩලය,**
**අංක 40, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.**
**දිනය : 2026.01.23**